# ජාතික අධ්‍යාපන ආයතනය

# ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමාව 2024/2025

ජාතික අධ්‍යාපන ආයතනයේ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන ඒකකය මගින් මෙහෙයවන ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන කණ්ඩායම බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :**

- අධ්‍යාපන අමාත්‍යංශය මගින් බඳවාගත් ක්‍රීඩා පුහුණුකරුවෙකු වීම සහ අ. පො.ස. උසස් පෙළ සමත් වීම හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම

හෝ

- අධ්‍යාපන අමාත්‍යංශය මගින් බඳවාගත් ක්‍රීඩා පුහුණුකරුවෙකු වීම, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්වීම සහ වසර 05ක සේවා පළපුරුද්ද සහ අධ්‍යාපන අමාත්‍යංශයෙන් මෙහෙය වූ මාස 06ක පුහුණුව ලබා තිබීම

හෝ

- පෞද්ගලික පාසලක හෝ ආයතනයක ක්‍රීඩා පුහුණුකරුවෙකු ලෙස සේවා පළපුරුද්ද සමග අ.පො.ස. උසස් පෙළ සමත්වීම හා අන්තර්ජාතික/ජාතික/පළාත් තරග ජයග්‍රහණය කර තිබීම.

**පාඨමාලා විස්තර :**

| | |
|---|---|
| කාලය | - වසර 02 යි |
| මාධ්‍යය | - සිංහල /දෙමළ |
| තෝරා ගැනීම | - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| පැවැත්වීමේ ක්‍රමය | - සති අන්ත (පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා) |
| ඉගැන්වීමේ ක්‍රමය | - සම්මුඛ සැසි |
| පාඨමාලා ගාස්තුව | - රු. 90,000/- (සමාන වාරික දෙකකින් ගෙවිය හැකිය.) මීට අමතරව අනුමත විභාග ගාස්තු ගෙවිය යුතුය. |
| ඉල්ලුම්පත්‍ර ගාස්තුව | - රු. 2,000.00 |
| ලියාදිංචි ගාස්තුව | - රු. 1,000.00 |

- පාඨමාලාව නියමිත පරිදි සම්පූර්ණ කිරීමෙන් පසු ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF (IV) අධ්‍යාපන මට්ටම සම්පූර්ණ කිරීමේ සහතිකය පිරිනැමේ.

**ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය**

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට පිවිස එහි සඳහන් පියවර අනුව පාඨමාලාව සඳහා අයදුම්පත් යොමු කළ යුතුය.
- අවසානයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත බාගත කර (download) විදුහල්පති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය ඇතිව ඕනෑම ලංකා බැංකු ශාඛාවක ඇති ජාතික අධ්‍යාපන ආයතන තැන්පතු පත්‍රිකාව භාවිත කර රු.2000.00 මුදලක් තැන්පත් කර එහි රිසිට්පත අයදුම්පතෙහි අලවා ඔබගේ නම, ලිපිනය සහිත රු.110.00ක මුද්දර ඇලවූ 9" X 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග **ඒකක ප්‍රධාන, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන ඒකකය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම** යන ලිපිනයට 2024 අගෝස්තු 15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ 'ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා උසස් ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025' යනුවෙන් සඳහන් කරන්න.
- විමසීම් : 0117 601777 (මාධව මයා) /0117 601714 (අරවින්ද මයා) සතියේ දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න.
- ඔබගේ ඉල්ලුම්පත්‍රය යම් හෙයකින් ප්‍රතික්ෂේප වුවහොත් ඉල්ලුම්පත්‍ර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

**සැලකිය යුතුයි :** ඔබ ඉල්ලුම් කරන මධ්‍යස්ථානයට ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබුණහොත් එම මධ්‍යස්ථානයෙහි පාඨමාලාව ක්‍රියාත්මක නොකරන අතර, ඔබගේ අභිමතය පරිදි ළඟම මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.

**පාඨමාලාව පළාත් නවය නියෝජනය වන සේ පහත සඳහන් පරිදි සිංහල මාධ්‍යය මධ්‍යස්ථාන අටක සහ දෙමළ මාධ්‍යය මධ්‍යස්ථාන දෙකක පැවැත්වීමට සැලසුම් කර ඇත.**

| | | |
|---|---|---|
| 1. | ජාතික අධ්‍යාපන ආයතනය | (සිංහල මාධ්‍යය) |
| 2. | බිංගිරිය අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 3. | රුහුණු අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 4. | නිල්වලා අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 5. | පුලතිසිපුර අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 6. | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 7. | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 8. | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (සිංහල මාධ්‍යය) |
| 9. | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (දෙමළ මාධ්‍යය) |
| 10. | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | (දෙමළ මාධ්‍යය) |

**මහාචාර්ය ප්‍රසාද් සේතුංග**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**